පන්නල ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
-----------------------------

**1.** <u>මූල්‍ය ප්‍රකාශන</u>

**1.1** <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 27 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

**1.2** <u>**තත්ත්වාගණනය කළ මතය**</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පන්නල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** <u>**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**</u>

**1.3.1** <u>**ගිණුම්කරණ අඩුපාඩු**</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලේ හිඟ ශේෂයෙන් ගෙවන ලද රු.1,200,000 ක මුදල හා ඉකුත් වර්ෂයේ නොවැම්බර් දෙසැම්බර් වාරික මුදල වූ රු. 24,565 ක මුදල සමුච්චිත අරමුදල් ගිණුමට හර කර විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත වියදම් ගිණුමට බැර කලයුතු වුවත්, ජර්නල් සටහන් අංක 17 න් රු.1,224,565 ක් විශ්‍රාම වැටුප් ගිණුමට හා ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ගිණුමට ගැලපුම් කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම හා ණය හිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භය වන විට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.4,400,396 ක් ලෙස දක්වා තිබියදී, සමාලෝචිත වර්ෂය අවසානයේදී නැවත ජර්නල් සටහන් අංක 59 මඟින් රු.1,724,961 ක් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම හා වියදම් ණය හිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ විශ්‍රාම වැටුප් බිල්පත අනුව ගෙවිය යුතු ශේෂය රු.1,974,091 ක් වුවද, ලෙජරයේ/ගිණුමේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ශේෂය රු.5,225,357 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ණය හිමියන් රු.3,251,266 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබී තිබූ රු.21,185,555 ක මුද්දර ගාස්තු ආදායම් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ආදායම් ණය ගැතියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු.8,459,063 ක් වුවද, එය රු.7,805,142 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.653,921 කින් වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) දින 180 සම්පූර්ණ කිරීම මත සේවය ස්ථිර කළ නිලධාරීන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ මුදලින් කොටසක් ලෙස ලැබී තිබූ රු.1,700,000 ක් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සභාව නමින් තැන්පත් කර ඇති ස්ථාවර තැන්පතු 04 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ලැබූ පොලී රු.28,340 ක් හා ලැබිය යුතු පොලී රු.13,440 ක්ද වශයෙන් එකතුව රු.41,780 ක මුදල පොලී ආදායම ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කුලියාපිටිය ශාඛාවේ තැන්පත් කර ඇති ස්ථාවර තැන්පත් 2 ක ශේෂය වූ රු.186,788 ක් ස්ථාවර තැන්පත් යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ශේෂ සනාථ සහතික අනුව සේවක ඇප තැන්පත් හා සේවක ඇප ආයෝජන ගිණුමේ ශේෂය රු.448,039 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.362,196 ක් ලෙස දක්වා තිබීම නිසා සේවක ඇප තැන්පත් හා සේවක ඇප ආයෝජන ශේෂය රු.85,843 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.80,652 ක් වටිනා ගෑස් තොගය අදාල වියදම් ගිණුම්වලට මාරුකර, තොග ගිණුම බැර නොකිරීම හේතුවෙන් වර්ෂයේ අවසාන තොග ශේෂය එම වටිනාකමින් වැඩියෙන්ද, සැපයුම් හා උපකරණ වියදම අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ අවසන් තොග ගණනය කිරීමේදී කොම්පෝස්ට් ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය හා කොන්ක්‍රීට් කණු ව්‍යාපෘතියේ ඉතිරිකණුවල වටිනාකම පිළිවෙලින් රු.150,000 ක් හා රු.213,750 ක් ගිණුම්වල පෙන්වා නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය අවසානයේ එකතු කළ අගය මත බදු ගිණුමේ රු.1,268,631 ක ව්‍යාජ වගකීම් ශේෂයක් සාමාන්‍ය ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

(ක) වැටකෙයාව හා කදානේ ගෙදර වෙළඳ සංකීර්ණ දෙකෙහි කඩකාමර 08කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.1,523,934 ක පෙර ගෙවුම් (කීමනී) මුදල් ණය ගැතියන් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේදී වරිපනම් බදු වෙනුවෙන් අඩු කරන ලද රු.298,321 ක දුන් වට්ටම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂය තුල ඉදිරි වර්ෂය සඳහා ලැබූ වරිපනම් බදු රු.117,290 ක් කලින් ලැබූ වරිපනම් බදු ලෙස ගිණුම්වල නොදැක්වීම නිසා එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ හිඟ හිටි වරිපනම් බදු ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 13 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා උපලේඛන අනුව ශේෂයන් අතර රු.59,906,714 ක නොසැසඳීම් පැවතුණි.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම් ශේෂ තුල නිශ්චිතව හඳුනා නොගත් රු.1,031,551 ක හිඟ හිටි ගෙවල් කුලී ශේෂයක් පැවති අතර, එම මුදල 2009 වර්ෂයේ සිට පැවත එන ශේෂයක් විය.

(ආ) ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී රු.11,000 ශේෂයක් හා ලැබිය යුතු මූලධන ආධාර රු.18,708,947 ශේෂයක් 2009 වර්ෂයේ සිට පැවත එන අතර, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ලැබිය යුතු ගිණුම් තුල රු.55,826,625 ක කර්මාන්ත ණය ගැති ශේෂයක් පැවති අතර, 2016 මාර්තු 31 දින වන විට රු.22,372,856 ක් ලැබී තිබුණි. රු.10,963,860 ක් 2013 ට පෙර සිට පවතින ශේෂයන් විය.

(ඈ) මාගොල්ලහේන ඉඩම හා ගොඩනැගිල්ල ගිරිඋල්ල පොලිස් ස්ථානයට කුලියට ලබාදී කුලිය වශයෙන් 1989 වර්ෂයේ සිට රු.312,918 ක ආදායමක් බිල්කර තිබුණි. නමුත් ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ඉඩමේ භුක්තිය පොලිස් දෙපාර්තමේන්තුවට භාරදී තිබූ බැවින් හිඟ ශේෂය අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) සිනමා ශාලාවක් පවත්වාගෙන යාම සඳහා බදුදී තිබූ ගිරිඋල්ල පිහිටි ඉඹුල්ගහමුල වත්ත නැමැති ඉඩම හා ගොඩනැගිල්ල වෙනුවෙන් අයවීමට තිබුණ රු.378,785 ක හිඟ ආදායම කපාහැරීමට 2013 වර්ෂයේදී යෝජනා කර පැවතියත් සමාලෝචිත වර්ෂය අවසානයේදී හිඟ ආදායම් ලෙස ගිණුම් වල දක්වා තිබුණි.

(ඊ) නිශ්චිතව වර්ෂය හඳුනාගත නොහැකි රු.669,016 ක හිඟ අක්කර බදු ශේෂයක් විය.

(උ) රු.2,528,588 ක සේවක ණය ශේෂය තුල මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 60 දෙනෙකුගෙන් අයවිය යුතු රු.100,353 ක් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

රු.86,034,616 ක් වටිනාකමැති ගිණුම් විෂයයන් 07 කට අදාලව විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් පිළිබඳ සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) 59 රීතිය | සෑම වර්ෂයක් ආරම්භයේදීම සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයන් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර අදාල වර්ෂයේ මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) | මු.රෙ. 171 (2) (අ) | 2015 දෙසැම්බර් 31 දින වන විට නොපියවූ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.321,978 ක් විය. |
| (ii) | මු.රෙ. 571 (2) | 1997 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලසීමාව තුල තැන්පත් කර තිබූ රු.19,819 ක් වූ මිශ්‍ර තැන්පත් ශේෂය ආදායමට ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,298,822ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,530,159ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුල පිළිවෙලින්රු.30,051,802ක් හා රු.242,443,846ක් වූ මූලධන ආදායම හා රු.25,937,319ක් හා රු.219,895,405ක් වූ මූලධන වියදම් ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේඅතිරික්තය රු.44,413,305 ක් වී තිබූ අතර, ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.40,078,600 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 4,334, 705 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍යසමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයේ සභාවේ මුළු මෙහෙයුම් අයභාරය රුපියල් මිලියන 152 ක්වූ අතර, එය පෙර වර්ෂයේ මුළු මෙහෙයුම් අයභාරය රුපියල් මිලියන 126 හා සසඳන විට රුපියල් මිලියන 26 ක වැඩිවීමක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මූලධන වියදම රුපියල් මිලියන 26 ක් වූ අතර, එය පෙර වර්ෂයේ මූලධන වියදම වූ රුපියල් මිලියන 220 හා සැසඳීමේදී රුපියල් මිලියන 194 ක අඩුවීමක් විය.

(ඇ) ඉහත තත්ත්වයන් හේතු කොටගෙන වර්ෂය සඳහා වන අතිරික්තය රුපියල් මිලියන 44 ක් වී ඇති අතර,එය ඉකුත් වර්ෂයේ අතිරික්තය වූ රුපියල් මිලියන 40 හා සැසඳීමේදී රුපියල් මිලියන 04 ක මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයක් විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය ලැබීම් | දෙසැම්බර් දිනට 31 සමුච්චිත හිඟය | අයවැයගත | තථ්‍ය ලැබීම් | දෙසැම්බර් දිනට 31 සමුච්චිත හිඟය |
| | 000‘ | 000‘ | 000‘ | 000‘ | 000‘ | 000‘ |
| වරිපනම් බදු | 8,115 | 7,870 | 3,164 | 8,115 | 7,726 | 3,789 |
| බදු කුලී | 21,425 | 20,400 | 1,759 | 21,425 | 19,318 | 3,587 |
| බලපත්‍ර ගාස්තු | 1,536 | 1,243 | - | 1,536 | 989 | - |
| වෙනත් ආදායම් | 120,029 | 122,168 | - | 120,029 | 103,706 | - |
| | 151,105 | 151,681 | 4,923 | 151,105 | 131,739 | 7,376 |

## 2.3.2 බිල්කළ ආදායම හා රැස්කළ ආදායම

**සාමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ආදායම් බිල් කිරීම, ආදායම් රැස්කිරීම හා හිඟහිටි ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| | ආදායමෙන් බිල් කිරීම | | | | ආදායමෙන් රැස් කිරීම | | | හිඟ හිටි ආදායම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ශීර්ෂ | 2015.01.01 වන දිනට හිඟ හිටි | 2015 වර්ෂයේ බිල් කිරීම | එකතුව | හිඟයෙන් රැස් කළ මුදල් | බිල් කිරීමෙන් රැස් කළ මුදල | ඉදිරි වර්ෂ සඳහා ලැබු මුදල | රැස්කළ මුදල | හිඟයෙන් ඉතිරි මුදල | බිල් කළ ආදායමෙන් හිඟ හිටි | එකතුව |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 3,085,246 | 3,772,254 | 6,857,500 | 1,541,580 | 2,522,178 | 298,321 | 4,362,079 | 1,543,666 | 951,775 | 2,495,441 |
| අක්කර බදු | 648,910 | 77,420 | 726,330 | 25,404 | 31,909 | 0 | 57,313 | 623,506 | 45,511 | 669,017 |
| බදු කුලී | 490,410 | 12,735,291 | 13,225,701 | 367,389 | 12,390,377 | 0 | 12,757,766 | 123,021 | 344,914 | 467,935 |
| බලපත්‍ර ගාස්තු | - | 880,950 | 880,950 | - | 880,950 | 0 | 880,950 | 0 | 0 | 0 |
| කඩ කුලී | 1,150,567 | 4,373,501 | 5,524,068 | 341,345 | 3,925,360 | 0 | 4,266,705 | 809,222 | 448,141 | 1,257,363 |
| වෙනත් | 805,454 | 15,369,620 | 16,175,074 | | 15,424,224 | 0 | 15,424,224 | 750,730 | 120 | 750,850 |
| මුද්දර ගාස්තු | - | 20,000,000 | 20,000,000 | 22,616,556 | 0 | 0 | 22,616,556 | - | 20,000,000 | 20,000,000 |
| උසාවි දඩ | - | 3,000,000 | 3,000,000 | 4,570,901 | 0 | 0 | 4,570,901 | - | 3,000,000 | 3,000,000 |
| එකතුව | 6,180,587 | ,602,209,036 | 66,389,623 | 29,463175, | 35,174,998 | 298,321 | 64,936,494 | 3,850,145 | 24,790,461 | 28,640,606 |

**(අ)** **වරිපනම් බදු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.2,495,421 ක්වූ අතර, එය වාර්ෂික බිල් කිරීමෙන් දළ වශයෙන් සියයට 66 ක් පමණ විය. එයින් 2016 වර්ෂයේ ජූලි වන විට රු.868,818 ක් අයකර තිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) 33 රීතිය ප්‍රකාරව වරිපනම් බදු පැහැර හරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තුවක් සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තු අවසානයේදී වරිපනම් බදු ලිපිකරු විසින් පිළියෙල කොට ලේකම්වරයාගේ අත්සන සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 143 (i) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියලු ඉඩම් හා ගොඩනැගිලි සෑම වසර 05 කට වරක් තක්සේරුවක් කළ යුතු වුවත්, සභාවේ පවතින වරිපනම් තක්සේරුව වසර 09 ක් ඉක්මවා ගොස් තිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 136 වගන්තියේ විධිවිධාන අනුව සභා සීමාව තුල පිහිටි සභාවට අයත් බදු දෙන ලද සියළු ඉඩම් හා ගොඩනැගිලිවල බදුකරුවන්ගෙන් වරිපනම් බද්ද හෝ අකක්ර බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු වුවත්, සභා සතු දේපල 245 කට අදාළව පනතේ විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.4** **බදු කුලී**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) (ඊ) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු බදු කුලී විධිමත් පරිදි ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**2.3.5** **උසාවි දඩ**

වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,888,657 ක උසාවි දඩ අයවිය යුතුව තිබුණි. එයින් 2016 මැයි 31 දින වන විට රු.1,222,165 ක් අයවී නොතිබුණි.

**2.3.6** **මුද්දර ගාස්තු**

සමාලෝචිත වර්ෂය අවසානයට වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අය කරගත යුතුව තිබූ මුද්දර ගාස්තු වටිනාකම රු. 9,430,769 ක් විය. එයින් රු.6,490,861 ක ශේෂයක් 2016 මැයි 10 වන විට අයවී නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ ස්ථාවර වත්කම් ලේඛනය සභාව සතු සියළු වත්කම් ඇතුලත්වන පරිදි නඩත්තු කර නොතිබූ අතර, සේප්පුව තුල ඇති ඔප්පුවල විස්තර පමණක් ලේඛනයට ඇතුලත් කර ඇති බවත්, ඔප්පු නොමැති ඉඩම්වල විස්තර ඇතුලත්ව නොතිබුණි.

(ආ) වැටකෙයාව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 05 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටද රු. 383,590 ක "එක්වත්" මුදල් අයකරගෙන නොතිබූ අතර, 2004 වර්ෂයේ සිට විවිධ අවස්ථාවලදී මෙහි කඩ කාමර ලබාදී තිබුණි. මෙම වෙළඳ සංකීරණය සඳහා ජලය හා විදුලිය පහසුකම් සැපයීමට අවශ්‍ය කටයුතු සිදු නොකිරීම මත ආසන්න වශයෙන් සභාවට බිල්කල හැකිව තිබූ රු. 2,000,000 කට අධික කුලී මුදලක් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) මිලියන 13 කට වැඩි මුදලක් වැයකර ඉදිකරන ලද කදානේ ගෙදර සාප්පු සංකීර්ණයේ කඩ කාමර 10 න් 07 ක් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් වී නොතිබූ අතර ටෙන්ඩර්ගතව තිබූ කඩ කාමර ද විවෘත කර නොමැති බැවින් වසර 04 කට අධික කාලයක සිට මෙම වෙළඳ සංකීර්ණයෙන් කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

### 3.2 හඳුනාගත්අලාභ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවක අර්ථසාධක අරමුදලට දායකමුදල් නියමිත දිනට නොගෙවීම මත රු. 93,283 ක අධිභාර මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. එයින් රු.7,000 ක් පමණක් අදාල නිලධාරින්ගෙන් අයකර තිබුණි.

(ආ) 1980 අංක 46 දරන සේවා නියුක්ති භාර අරමුදලට රු. 8,558 ක් අධිභාරයක් ගෙවා තිබුණි. එයින් රු.1,720 ක් සභාව අයකර ගෙන තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දින හා අංක PFD/RED/01/04/214/01 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව අදාල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කලයුතු වුවත්, ඊට වෙනස් ආකාරයේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි.

## 4.2 මානව සම්පත් කළමනාකරණය

**අනුමත තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 06 ක් සඳහා නිලධාරීන් 36 දෙනෙකු බඳවාගෙන තිබුණද, කාර්යය මණ්ඩලය යාවත්කාලීන කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 05. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ණයගැති හා ණයහිමි පාලනය
(ඈ) සේවක ණය පාලනය